මගේ අංකය-ප/24/1/විවිධ
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

2009.06. 19

10

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ
නිල නිවාසවල පදිංචි සියළු නිළධාරීන් වෙත,

**සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිල නිවාස**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිල නිවාස නඩත්තුව සහ පරිහරණය ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ විධිවිධාන අනුව විය යුතු බැව් අවධාරණය කරමි. එහිදී පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය කාරුණිකව යොමු කරවමි.

I. නිළධාරීන් වෙත වෙන් කර දුන් නිල නිවාස රජයේ පොදු දේපළක් ලෙස සළකා තමන්ගෙන් පසුව එන නිළධාරීන් වෙත මනා තත්ත්වයෙන් ආපසු භාරදිය යුතුය යන පදනම මත පිහිටා නිල නිවස පරිහරණය කළ යුතුය.

II. නිවසෙහි බිත්තිවලට හානි කිරීමද,නිල නිවසෙහි කාමර ස්ථිර ලෙස වෙන් කරන ආවරණ යෙදීමෙන්ද වැලකී සිටිය යුතුය.

III. නිල නිවාස ඇතුලත මෙන්ම පිටතද අතුගා,මකුළුදැල් කඩා,කාණු පිරිසිදු කර පවිත්‍රතාවය ඉතා හොඳ මට්ටමක පවත්වා ගත යුතුය.

IV. නිල නිවාස පරිශ්‍රය හා ප්‍රවේශ මාර්ගද පිරිසිදුව පවත්වාගෙන යා යුතුවේ. සාමුහිකව පිහිටි නිල නිවාසවල පදිංචි නිළධාරීන් කාලීනව එක්ව ශ්‍රමදාන පවත්වා ප්‍රවේශ මාර්ග හා වටපිටාව එළි පෙහෙළිකර පිරිසිදුව තබාගත යුතුය. පළාත් පාලන නීති හා පරිසර නීති ආරක්ෂා කිරීමට පුර්ණ අවධානය යොමු විය යුතුයි. නිල නිවාසයේ පදිංචි අයගේ මෙන්ම අවට පදිංචිකරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා වන ආකාරයට නිවාස පරිශ්‍රය නඩත්තු කළ යුතුය.

V. ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6:8 වගන්තිය ප්‍රකාරව නැතිවූ හෝ කැඩී බිඳී ගිය උපකරණ ආදිය යලි සවිකිරීම සඳහාද , සාමාන්‍ය පාවිච්චිය නිසා අබලන් වී ගියා සේ සැලකිය නොහැකි නිවාසයට සිදුවී ඇති අනෙක් අලාභහානි සඳහාද යන වියදම නිවාසයේ පදිංචිවී සිටින නිළධාරියගෙන් අයකරනු ලැබේ.

VI. නිල නිවසට සිදුකරන ලද සියළුම අළුත්වැඩියාවන් හා සවිකිරීම් පිළිබඳව වට්ටෝරු ලේඛනයට ඇතුලත් කිරීම සඳහා පරිපාලන අංශය වෙත වාර්තා කල යුතුවේ.

VII. ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6:3 වගන්තිය ප්‍රකාරව රජයේ නිවාසයක පදිංචිවිය හැක්කේ එය ලබාගත් නිළධාරියාට සහ ඔහුගේ බිරිඳටද ,දරුවන්ට හා යැපෙන්නන්ටද පමණි.නිවාස වෙන් කර දෙන බළධාරියාගෙන් ලබාගත් නිශ්චිත අවසරය රහිතව වෙනත් පුද්ගලයෙකුට නිරන්තර පදිංචිය සඳහා රජයේ කිසිම නිවාසයක කිසිම කොටසක් නොපැවරිය යුතුය.

VIII. ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6:4 වගන්තිය ප්‍රකාරව නිවාස අතුරු බද්දට දීමද මුදල් ගෙවා නවතින අමුත්තන් සහ නේවාසිකයන් තබාගැනීමද තහනම්ය.

IX: ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6:3 හා 6:4 වගන්තිය උල්ලංඝනය කරන්නේ නම් වහාම නිල නිවසෙන් ඉවත් කිරීමට පියවරගනු ලැබේ.

X. යම්කිසි තනතුරකට වෙන්කරන ලද නිවාසයන් හැර අනෙකුත් සියළුම නිවාසවල බදුකාලය වර්ෂ 05ක්වේ. එම බදු කාලය අවසන් වූ වහාම පොරොත්තු ලේඛනයේ ඊළඟට සිටින නිලධාරියාට නිල නිවාසයක් ලබා දීමට හැකිවන පරිදි නිල නිවසේ පදිංචියෙන් ඉවත්විය යුතුය.

02.ඔබ වෙත පවරා දී ඇති නිල නිවස හා පරිශ්‍රයේ මායිම් සම්බන්ධව ගැටළු හෝ අනවසර ඇතුලත්වීම් සම්බන්ධව වහාම වාර්තා කල යුතුවේ.

05. ඉහත උපදෙස් අනුව නිල නිවාස පරිහරණය කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. තවද නිල නිවාස කමිටුව මගින් පත්කරනු ලබන කමිටුවක් මගින් මෙම නිල නිවාස පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීමේ වැඩ පිළිවෙලක්ද ඇරඹීමට බලාපොරොත්තු වන බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

H.M.S.P.හේරත්
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත.

| | |
|---|---|
| 01.විගණකාධිපති | -කාරුණික දැ.ගැ.පි. |
| 02.අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | -කාරුණික දැ.ගැ.පි. හා අ.ක.ස. |
| 03.සියළුම අධ්‍යක්ෂවරුන් | -කාරුණික දැ.ගැ.පි. හා අ.ක.ස. |